 සැ. යු. -2009.03.06 දින පළ වූ අංක 1,592 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,593 - 2009 මාර්තු මස 13 වැනි සිකුරාදා - 2009.03.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | | පිටුව |
|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය | ... | 342 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය | ... | 175 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | | — |
| වෙනත් පත්කිරීම් ආදිය | ... ... ... ... | 175 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය | ... ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන | ... ... ... | 342 |
| මිල පාලන දැන්වීම් | ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් | ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන | ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා | ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් | ... ... ... | 344 |
| නැවියන්ට දැන්වීම් | ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් | ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 මාර්තු මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 මාර්තු මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2009 අංක 102

DVF/RECT/143(V)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ස්වේච්ඡා උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2006 මැයි මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් (උපකරණ පාලක) (පොදු රාජකාරී) එදිරිමුණි සුදිගු රම්‍ය සුනිල් ද සිල්වා, ගරෙ (නි/5992)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

03-337

# ආණ්ඩුවේ නිවේදන

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

2002 අංක 17 දරන මැනුම් පනත - 27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කිරීම

2002 අංක 17 දරන මැනුම් පනතේ 27 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කරමින් 2008.04.04 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය 2009.02.04 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙසේ සංශෝධනය කරමි.

(අ) නිලබලයෙන් සාමාජිකයින් වන තැනැත්තන්,

| | | | |
|---|---|---|---|
| i. | සම්පතාවඩුගේ මහේස් විශ්වරාජ් ප්‍රනාන්දු | - සර්වේයර් ජනරාල් (කාර්යනියුක්ත) | - සභාපති |
| ii. | කනගරත්නම් තවලිංගම් | - අතිරේක සර්වේයර් ජනරාල් | - උප සභාපති |

ජීවන් කුමාරතුංග,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

වර්ෂ 2009 ක් වූ පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

03-284

---

**වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසි - 1951**
**03 වැනි රෙගුලාසිය යටතේ නිවේදනය**

වර්ෂ 1951 අප්‍රේල් මස 13 වැනි දින අංක 10234 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලදුව, 1951 ජූනි මස 29 වැනි දින අංක 10263 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් ද, 1952 මැයි 02 වැනි දින අංක 10390 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද වන්දනා (යාපනය

දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් ද, 1956 ජුනි මස 21 වැනි දින අංක 10943 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් ද, 1966 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 14715 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් ද, 1975 මාර්තු මස 07 වැනි දින අංක 154 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් ද. සංශෝධනය කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසි පහත සඳහන් කෝවිල් සහ දේවාලවලට 2009 වර්ෂය තුළ දී කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් බලපැවැත්වෙන කාලය වශයෙන් උත්සව වාර මෙයින් නිම කරන ලදී.

| | | *පටන් ගන්නා දිනය* | *අවසන් වන දිනය* |
|---|---|---|---|
| 1. | කච්චතීවු ශාන්ත අන්තෝනි පල්ලිය | 2009.03.07 | 2009.03.08 |
| 2. | මරුකඩි පිල්ලයාර් කෝවිල්, මානිපායි | පුනරාවර්ධන වැඩ නොසම්පූර්ණ කර ඇති | |
| 3. | සුට්ටිවරම් අම්මන් කෝවිල් | 2009.06.08 | 2009.06.21 |
| 4. | බුද්ධ විහාරය, නයිනාතීවු - වෙසක් | 2009.05.08 | 2009.05.09 |
| 5. | බුද්ධ විහාරය, නයිනාතීවු - පොසොන් | 2009.06.07 | |
| 6. | නයිනාතීවු තංගපුෂණී අම්මන් කෝවිල් | 2009.06.23 | 2009.07.07 |
| 7. | ශාන්ත සෙපමාලයි මාතා දේවාලය, සිත්තමඩු | 2009.07.27 | 2009.08.05 |
| 8. | කන්දසාමි කෝවිල්, මාවිඩ්ඩපුරම් | 2009.07.27 | 2009.08.21 |
| 9. | කීරිමලෙයි ආඩි අමාවාසයි | 2009.08.21 | |
| 10. | සෙල්වසන්නිදි කෝවිල්, කොන්ඩමානාරු | 2009.08.20 | 2009.09.04 |
| 11. | ශ්‍රී දුර්ගාදේවි දේවස්ථානය, තෙල්ලිප්පලෙයි | 2009.08.22 | 2009.09.02 |
| 12. | ශ්‍රී වල්ලිපුර ආල්වාර් කෝවිල්, තුන්නාලයි | 2009.09.18 | 2009.10.04 |
| 13. | වල්යාත්‍රයි මාතා දේවස්ථානය. සාඩඩි, වේලනයි | 2009.09.10 | 2009.09.19 |
| 14. | සෙල්වසන්නිදි කෝවිල්, තොන්ඩමානාරු, කන්දසෂ්ඩි උත්සවය | 2009.10.19 | 2009.10.25 |

ඒ. සිවසුවාමි,
අතිරේක දිසාපති,
*යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.*

2009 පෙබරවාරි මස 13 වැනි දින,
යාපනය දිසාපති කාර්යාලයේ දී ය.

03-259

---

එල්. ඩී. බී. 277/40.

**(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

18 වැනි වගන්තිය යටතේ නියමය

(188 වැනි අධිකාරිය වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංස්කෘතික කටයුතු සහ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන වන මා විසින් මේ නියමය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා "ආරක්ෂක ස්මාරක" වශයෙන් සළකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරමි.

ඉහත කී ස්මාරක සම්බන්ධයෙන් වන දැන්වීම පුරාවස්තු ආඥාපනතේ 19 වැනි වගන්තිය ප්‍රකාරව 2009.01.23 වැනි දින අංක 1,586 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලදී.

සංස්කෘතික කටයුතු සහ ජාතික
*උරුමයන් පිළිබඳ අමාත්‍ය.*

කොළඹ දී ය.

**ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන ස්මාරක උපලේඛනය**

නැගෙනහිර පළාතේ, කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකුණාමලය, ග්‍රාම නිලධාරී වසමේ, පිහිටි උතුරට : ඩොක්යාඩ් පාර ද, නැගෙනහිරට : වන්නියාර් ලේන් (වන්නිගර් පාර) ද, දකුණට : නෙල්සන් සිනමා ශාලාව ද, බටහිරට : ග්‍රීන් පාරට ද මායිම් වූ, පෞරාණික බෝගස් හතර (04) සහිත භූමිය.

03-273

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230001422.

ණයකරුගේ සම්පූර්ණ නම : ගුණානන්ද හැන්දි සුසන්ත.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ආර්. බී. චන්ද්‍රසිරි විසින් ලියා සහතික කරන ලද අංක 3205 හා 2004.08.14 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ දහඅටදහස් හත්සිය විසිදෙකයි ශත විසිහයක (රු. 7,18,722.26) මුදලක් වර්ෂ 2007.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හයලක්ෂ හැටඅටදහස් හාරසිය හතලිහයි ශත පනස්හයක (රු. 6,68,440.56) මුදල ද වර්ෂ 2007.01.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් පනස්දහස් දෙසීය අසූඑකයි ශත හැත්තෑවක් (රු. 50,281.70) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හත්ලක්ෂ දහඅටදහස් හත්සිය විසිදෙකයි ශත විසිහයක (රු. 7,18,722.26) ද,

(2) එකී රුපියල් හයලක්ෂ හැටඅටදහස් හාරසිය හතලිහයි ශත පනස්හයක (රු. 6,68,440.56) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.25% බැගින් වන පොලියක් 2007.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ මාර්තු මස 30 වැනි දින යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසියපත්තුවේ, අළුත්කුරු කෝරළේ, කටුනායක සීදුව නගර සභා සීමාවේ අමන්දොළුව ග්‍රාමයෙහි පිහිටි ගොරකගහවත්ත නමැති ඉඩමට 2002.05.16 දින පී. ඩී. එන්. පීරිස් මානක තැන විසින් මැන සම්පාදිත අංක 2039 පිඹුර ප්‍රකාර ලොට් 7ට මායිම්, උතුරට : ලොට් 11 ද, නැගෙනහිරට : ලොට් 8 ද, දකුණට : පිඹුරු අංක 4556හි ලොට් 2ඒ ද, බටහිරට : ලොට් 6 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.50) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 888/131හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

03-334

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2400001040.

ණයකරුගේ සම්පූර්ණ නම : සෝමසුන්දරම් ක්‍රිෂ්ණ කුමාර්.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඩබ්. කීගල් විසින් ලියා සහතික කරන ලද අංක 3182 හා 2003.11.21 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් තුන්දහස් තුන්සිය විසිතුනයි ශත තිස්තුනක (රු. 2,43,323.33) මුදලක් වර්ෂ 2006.03.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ දහ නවදහස් හයසිය හැටදෙකයි ශත අසූඑකක (රු. 2,19,662.81) මුදල ද, වර්ෂ 2006.03.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිතුන්දහස් හයසිය හැටයි ශත පනස් දෙකක් (රු. 23,660.52) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතලිස් තුන්දහස් තුන්සිය විසිතුනයි ශත තිස්තුනක (රු. 2,43,323.33) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ දහනව දහස් හයසිය හැටදෙකයි ශත අසූඑකක (රු. 2,19,662.81) මුදල මත අයවිය යුතු වර්ෂයකට 9.50% බැගින් වන පොලියක් 2006.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ

වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ මැයි මස 22 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, උඩ දකුණ පත්තුවේ, රත්නපුර මහනගර සභා සීමාවේ රත්නපුර ග්‍රාමයේ 1 වැනි පටුමඟ, සිරිපාද මාවතේ, වරිපනම් අංක 15හි පිහිටි ඕවේමුකලාන නමැති ඉඩමට 2003.07.02 වැනි දින ඒ. රත්නම් මානක තැන විසින් මැන සම්පාදිත අංක 566/03 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : ලොට් 41 (පාර) ද, නැගෙනහිරට : ලොට් 24 ද, දකුණට : රජයේ ඉඩම ද, බටහිරට : ලොට් 22 යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයක (අ. 0, රූ. 0, පර්. 19) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 666/63හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

03-333

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0155500154.

ණයකරුගේ සම්පූර්ණ නම : වීරසිංහ ආරච්චිලාගේ සේපාල.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඩබ්. කීගල් විසින් ලියා සහතික කරන ලද අංක 3685 හා 2005.01.19 වැනි දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හැත්තෑ හතරදහස් හාරසිය දොළහයි ශත අනූවක (රු. 2,74,412.90) මුදලක් වර්ෂ 2007.04.30 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ හතලිස් නවදහස් හාරසිය අනූනවයයි ශත පනස් අටක (රු. 2,49,499.58) මුදල ද වර්ෂ 2007.04.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිහතරදහස් නවසිය දහතුනයි ශත තිස්දෙකක් (රු. 24,913.32) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හැත්තෑ හතරදහස් හාරසිය දොළහයි ශත අනූවක (රු. 2,74,412.90) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ හතලිස් නවදහස් හාරසිය අනූනවයයි ශත පනස් අටක (රු. 2,49,499.58) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12% බැගින් වන පොළියක් 2007.05.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ ජූලි මස 23 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, උඩ පත්තුවේ, කුරුවිට ප්‍රාදේශීය සභා සීමාවේ දොඩම්පෙ ග්‍රාමයෙහි පිහිටි කුරුගම්මෝදරවත්ත නමැති ඉඩමට 1992.08.02 වැනි දින එම්. සමරසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 2144 පිඹුර ප්‍රකාර ලොට් 39 ට මායිම්, උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : බණ්ඩාර අස්සැද්දුම ද, දකුණට : ලොට් 38 ද, බටහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් බිංදුවයි හයයි දශම බිංදුවක් (අ. 0, රූ. 2, පර්. 6.0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 686/163හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

03-332

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2405500106.

ණයකරුගේ සම්පූර්ණ නම : වීරසිංහ පතිරණගේ ප්‍රගීත් මධුසංඛ.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඩබ්. කීගල් විසින් ලියා සහතික කරන ලද අංක 3225 හා 2004.01.06 වැනි දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්හත්දහස් පන්සිය පනස්දෙකයි ශත හතක (රු. 2,37,552.07) මුදලක් වර්ෂ 2007.04.30 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ දහතුන්දහස් තිස්හතරයි ශත හතලිස් එකක (රු. 2,13,034.41) මුදල ද වර්ෂ 2007.04.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිහතරදහස් පන්සිය දාහතයි ශත හැටහයක් (රු. 24,517.66) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස්හත්දහස් පන්සිය පනස්දෙකයි ශත හතක (රු. 2,37,552.07) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ දහතුන්දහස් තිස්හතරයි ශත හතලිස් එකක (රු. 2,13,034.41) මුදල මත අයවිය යුතු වර්ෂයකට 9.50% බැගින් වන පොළියක් 2007.05.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ මැයි මස 30 වැනි දින යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, තඹගම්පත්තුවේ, තිඹොල්කැටිය ග්‍රාමයෙහි පිහිටි ඉඩමට 2002.09.16 වැනි දින ජී. ඩබ්. කේ. මනම්පේරි මානක තැන විසින් මැන සම්පාදිත අංක 1766 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : F. V. P. 791හි ලොට් 115 (පාර) ද, නැගෙනහිරට : F. V. P. 791හි ලොට් 120 ද, දකුණට : F. V. P. 791හි ලොට් 17 ද, බටහිරට : F. V. P. 791හි ලොට් 118 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසිදෙකයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 22.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO 12/2745හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

03-331

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2400000882 සහ 2400001120.

ණයකරුගේ සම්පූර්ණ නම : සුසිල් ගුණතිලක ලියනගේ.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඩබ්. කීගල්, වයි. එල්. පී. ආර්. කරුණාතිලක විසින් ලියා සහතික කරන ලද අංක 2660, 128 හා 2001.08.06, 2006.03.31 වැනි දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ එක්දහස් දෙසීයයි ශත දහතුනක (රු. 3,01,200.13) මුදලක් වර්ෂ 2007.12.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ අසූතුන්දහස් හයසිය තිස්හතයි ශත නවයක (රු. 2,83,637.09) මුදල ද වර්ෂ 2007.12.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් දාහත්දහස් පන්සිය හැට තුනයි ශත හතරක (රු. 17,563.04) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ එක්දහස් දෙසීයයි ශත දහතුනක (රු. 3,01,200.13) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ අසූතුන්දහස් හයසිය තිස්හතයි ශත නවයක (රු. 2,83,637.09) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.90% බැගින් වන පොළියක් 2008.01.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ පෙබරවාරි මස 26 වැනි දින යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, මැදපත්තුවේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ උතුරු කරදන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කරදන ග්‍රාමයේ හි පිහිටි කීනගහවිල මූකලාන නමැති ඉඩමට 1997.12.12 වැනි දින ඒ. රත්නම් මානක තැන විසින් මැන සම්පාදිත අංක 6456 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : FVP 219හි අංක 2084 සහ 2097 ද, නැගෙහිරට : FVP 219හි අංක 2086 සහ 2097 ද, දකුණට : FVP 219හි අංක 2086 සහ 2083 ද, බටහිරට :FVP 219හි අංක 2084 ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් තිස්දෙකයි දශම දෙකයි අටක (අ. 0, රූ. 2, පර්. 32.28) වපසරයිකත් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO V 5/172 සහ LDO V 5/180හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

03-330

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට මාතර ප්‍රසිද්ධ නොතාරිස් සී. එස්. පිනිදිය විසින් ලියා සහතික කරන ලද අංක 11909 හා 2001 ජූලි මස 13 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු- මුදල් ගෙවීම හවුල් ව්‍යාපාරයක් ලෙස, වඳුරඹ ව්‍යාපාරය කරගෙන යන උදාර චමින්ද අලස් සහ ඉඹුල්ගොඩ හේවාගේ ලීලා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 සැප්තැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 11909 දරන උකස් බැඳුම්කරය මත එකී උදාර චමින්ද අලස් සහ ඉඹුල්ගොඩ හේවාගේ ලීලා යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් නවලක්ෂ අසූ හත් දහස් අටසිය දහ නවයකුත් ශත අසූවක (රු. 9,87,819.80) මුදලක් සහ 2008 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හත්ලක්ෂ දහතුන්දහස් එකසිය අනූ එකකුත් ශත හතළිස් හතක් (රු. 7,13,191.47) සඳහා වර්ෂයකට සියයට දහසයකුත් දශම අටයි අට (16.88%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් නවලක්ෂ අසූහත් දහස් අටසිය දහනවයකුත් ශත අසූවක (රු. 9,87,819.80) මුදල සහ 2008 ඔක්තෝබර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හත්ලක්ෂ දහතුන්දහස් එකසිය අනූඑකකුත් ශත හතළිස් හතක් (රු. 7,13,191.47) සඳහා වර්ෂයකට සියයට දහසයකුත් දශම අටයි අට (16.88%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 11909 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 11909 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගඟබඩ පත්තුවේ, ඉහල ලේල්වල පිහිටි, "වැලිදෙණිය එස්ටේට්" නමැති ඉඩමේ, රජයේ මිනින්දෝරු වී. ගොඩහේන විසින් මැන සාදන ලදුව ගාල්ල මැනුම් අධිකාරී කේ. ගාර්දිහේවා විසින් සර්වේයර් ජනරාල්වරයා වෙනුවට සහතික කරන ලද අංක ජී/776 හා 1975.06.04 වැනි දින දරන මූලික පිඹුරේ දැක්වෙන ලොට් අංක 4 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : පී. පී. අංක 11198/3 දරන බිම් කට්ටිය ද, උතුරු-නැගෙනහිරට : පී. පී. ජී./776 පිඹුරේ ලොට් අංක 5 ද, නැගෙනහිරට : පී. පී. 11829/10 දරන බිම් කට්ටිය ද, දකුණට : ටී පී. අංක 352292, 353114, 350395 සහ 353114 දරන බිම් කට්ටිය ද, දකුණු-නැගෙනහිරට : ටී. පී. අංක 316583 දරන බිම් කට්ටිය සහ උතුරු - බස්නාහිරට : ටී. පී. අංක 350395 සහ 348263 දරන බිම් කට්ටිය සහ ඩී. අයි. රෝමානිස් සහ තවත් අය හිමිකම් කියන මිල්ලගහමුලන කුඹුර, පී. පී. 11198/3, මළදොළ හා පී. පී. ජී/776 හි ලොට් අංක 3 ද යන මායිම් ඇතුළත අක්කර හතරකුත් රූඩ් තුනකුත් පර්චස් විසි එකක් (අ. 4, රූ.3, පර්. 21) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත. දැනට මෙම ඉඩම අක්මීමන, බලයලත් මිනින්දෝරු එස්. ඒ. ලොකුනාරංගොඩ විසින් මැන සාදන ලද අංක 20 හා 1998.08.02 වැනි දින දරන පිඹුරේ "ලොට් ඒ" ලෙස නිරූපණය කර ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගඟබඩ පත්තුවේ, ඉහල කීඹියේ පිහිටි (ටී. පී. අංක 348061) ඇඳගලගාව හේන නමැති ඉඩම වන උතුරට : ගුණරත්න මුදලිතුමා හිමිකම් කියන ඇඳගලගාව කුඹුර ද, නැගෙනහිරට : ගුණරත්න මුදලිතුමා හිමිකම් කියන ඇඳගලගාව කුඹුර සහ රජයට අයත් යැයි කියන බෙනලඟ කන්ද දෙණිය ද, දකුණට : රජයට අයත් යැයි කියන ඇඳගලගාව හේන ද, බස්නාහිරට : පාර දිගට ඇති රිසවේසම ද යන මායිම් ඇතුළත අක්කර තුනකුත් පර්චස් විසිනවයක් (අ.3, රූ.0, පර්. 29) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි

ගසකොළ යනාදිය ද වේ. මෙම ඉඩම ගාල්ලේ බලයලත් මිනින්දෝරු එම්. ජී. ලයනල් විසින් මැන සාදන ලද අංක 175 හා 2000.11.20 දින දරන පිඹුරේ "ලොට් ඒ" ලෙස නිරූපණය කර ඇත.

ඉහත සඳහන් ඉහල ලේල්වල පිහිටි "මහමුලනගොඩ" නමැති ඉඩම වන උතුරට : ටී. පී. අංක 325030 ද, නැගෙනහිරට : ටී. පී. අංක 216357 සහ පී. පී. අංක 11823 හි ලොට් අංක 5 ද, දකුණට : පී. පී. අංක 11823 හි ලොට් අංක 7 ද, බස්නාහිරට : ගුණරත්න මුදලිතුමා සහ තවත් අය හිමිකම් කියන මහමුලන ද යන මායිම් ඇතුළත සර්වේයර් ජනරාල්වරයා සකස් කළ අංක 348264 දරන හිමිකම් පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් විසි නවයක් (අ. 0, රූ. 1, පර්. 29) බිම් ප්‍රමාණයෙන් යුත් එහෙත් දැනට එහි බිම් ප්‍රමාණය රූඩ් එකකුත් පර්චස් විසිහතරක් (අ. 0, රූ.1, පර්. 24) වන ඉඩමේ බිම සහ එහි පිහිටි සියලු වැවිලි ද වේ.

මෙම ඉඩම ගාල්ලේ බලයලත් මිනින්දෝරු එම්. ජී. ලයනල් විසින් සාදන ලද අංක 190 හා 2001.03.04 දින දරන පිඹුරේ ලොට් බී ලෙස ලකුණු කර පහත දැක්වෙන පරිදි නිරූපණය කර ඇත.

ඉහත සඳහන් ඉහල ලේල්වල පිහිටි මහමුලනගොඩ නමැති "වැලිදෙණිය එස්ටේට්" යනුවෙන් ද හැඳින්වෙන් ඉඩමේ, බලයලත් මිනින්දෝරු එම්. ජී. ලයනල් විසින් මැන සාදන ලද අංක 190 හා 2001.03.04 දින දරන පිඹුරේ ලොට් "බී" ලෙස දැක්වෙන ඉඩම වන උතුරට : පිටිහරාවට යන මහ පාර සිට දිවෙන පාර ද, නැගෙනහිරට : එකී අංක 190 දරන පිඹුරේ "ලොට් සී" දරන කට්ටිය ද, දකුණට : පී. පී.අංක 11823 හි ලොට් අංක 5 ද, බස්නාහිරට : ඉහත කී අංක 190 දරන පිඹුරේ "ලොට් ඒ" දරන කට්ටිය ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් විසි පහයි දශම හයක (අ. 0, රූ. 1, පර්. 25.6) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි යනාදිය ද වේ.

ඉහත සඳහන් ඉහල ලේල්වල පිහිටි "මහමුලනගොඩ" නමැති ඉඩම වන උතුරට : පී. පී. 11823 පිඹුරේ ලොට් අංක 4 හා 5 සහ ටී. පී. 216501 ඉඩම ද, නැගෙනහිරට : ටී. පී. අංක 220523 හා ටී. පී. අංක 220522 යන ඉඩම් සහ පී. පී. 11823 හි ලොට් අංක 6 ද, දකුණට : පී. පී. 11823 හි ලොට් අංක 8 සහ පාරක් සඳහා වෙන් කළ බිම ද, බස්නාහිරට : එල්. පී. 2083 ඉඩම ද යන මායිම් ඇතුළත සර්වේයර් ජනරාල්වරයා විසින් සකස්කරන ලද අංක 348265 හා 1922.03.20 දින දරන පිඹුර ප්‍රකාර අක්කර එකකුත් රූඩ් එකකුත් පර්චස් පහක් (අ. 1, රූ. 1, පර්. 05) බිම් ප්‍රමාණයෙන් යුත් එහෙත් දැනට අක්කර එකකුත් රූඩ් එකකුත් පර්චස් විසිහතරක් (අ.1, රූ.1, පර්.24) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු වැවිලි යනාදිය ද වේ.

මෙම ඉඩම දැනට ඉහත සඳහන් අංක 190 දරන පිඹුරේ "ලොට් ඒ" ලෙස ලකුණු කර පහත දැක්වෙන පරිදි නිරූපණය කර ඇත.

ඉහත සඳහන් ඉහල ලේල්වල පිහිටි "මහමුලනගොඩ" නමැති "වැලිදෙණිය එස්ටේට්" යනුවෙන් ද හැඳින්වෙන් ඉඩමේ, ඉහත කී අංක 190 දරන පිඹුරේ "ලොට් ඒ" ලෙස දැක්වෙන ඉඩම වන උතුරට : මහමුලන ද, නැගෙනහිරට : ඉහත කී අංක 190 දරන පිඹුරේ "ලොට් බී" සහ පී. පී. 11823 මහමුලනගොඩ ලොට් අංක 5 සහ 6 ද, ටී. පී. අංක 220522 ද, දකුණට : පී. පී. 11823 පිඹුරේ "ලොට් බී" ද, බස්නාහිරට : ටී. පී. 348265 ඉඩමේ කොටසක් සහ අංක එල්. පී. 2083 පිඹුරේ කොටසක් (දැනට පී. පී. 776 පිඹුරේ ලොට්අංක 4) ද යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් එකකුත් පර්චස් හයයි දශම හයක (අ.1, රූ.1, පර්.6.6) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි හා වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

03-315/3

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මතකර ගැණුනු යෝජනාව

ණය අංකය : 6/34204/බී6/280.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2004.02.13 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. හොරණ ප්‍රසිද්ධ නොතාරස් ප්‍රියානි පෙරේරා විසින් සහතික කරන ලද 1998.07.21 දින හා අංක 674 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම හඳපාන්ගොඩ පදිංචි සමනක්කොඩිගේ දීප්ති නයනා ප්‍රියදර්ශනී හෙවත් දීප්ති නයනා ප්‍රියදර්ශනී සමනක්කොඩි සහ ජයරත්න විමලසූරිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.12.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ අනූඅට දහස් තුන්සිය විසිතුනයි ශත හතළිස් හත (රු. 298,323.47) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 674 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය දහතුනයි ශත හතර (රු. 113.04) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද, මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ. හඳපාන්ගොඩ, සහ කොටිගල පිහිටි ඇටදාහවතුකැලේ සහ පැලැන්ගහලන්ද නමැති ඉඩමෙන් බලය ලත් මිනින්දෝරු ඩී. ඒ. ධර්මසිරි විසින් සකසන ලද 1996.09.06 සහ 1997.09.27 දිනයන් දරන අංක 802 දරන පිඹුරේ කැබලි අංක ඩී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ.01, පර්.0 ක්වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමග වේ.

තවද, පිඹුරු අංක 539 හි කැබලි අංක 79 මතින් ඇති මාර්ග අයිතීන් ද සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

03-322/2

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි මහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට බදුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 1588 හා 2006 ඔක්තෝබර් 16 දින දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු- මුදල් ගෙවීම "දිසානායක හාඩ්වෙයාර්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන දිසානායක මුදියන්සේලාගේ ජීවන් ඉන්දික දිසානායක අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 සැප්තැම්බර් 30 වන දිනට ඉහත කී 1588 දරන උකස් බැඳුම්කරය මත එකී දිසානායක මුදියන්සේලාගේ ජීවන් ඉන්දික දිසානායක යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හත් ලක්ෂ තිස් දෙදස් හයසිය අසූ දෙකකුත් ශත අසූ එකක (රු. 7,32,682.81) මුදලක් සහ 2008 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ හතළිස් හත්දහස් අටසිය හැට හතකුත් ශත පනස් පහක (රු. 6,47,867.55) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩ කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්.පී.ආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හත් ලක්ෂ තිස් දෙදස් හයසිය අසූ දෙකකුත් ශත අසූ එකක (රු. 7,32,682.81) මුදලක් සහ 2008 ඔක්තෝබර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ හතළිස් හත්දහස් අටසිය හැට හතකුත් ශත පනස් පහක (රු. 647,867.55) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩ කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්.පී.ආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1588 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත් විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන( පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 1588 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය ඇතුළත, වැදිරට කෝරළේ, බුත්තල, මුප්පනේ, බණ්ඩාර වාඩියේ පිහිටි, "රත්මල්ගස්ආර" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමෙන් බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට: බණ්ඩාරවාඩිය සිට නක්කලට යන මහ පාර ද, නැගෙනහිරට : රත්මලේ ඔය නොහොත් රත්මල්ගස් ආර ද, දකුණට : එච්. එම්. මුදලිහාමිට බදු දී තිබෙන FVP 172 ලොට් අංක 56 දරන ඉඩම ද, බස්නාහිරට : රජයට අයත් සිහින්කැලේ (Crown Seehin Kele) ද යන මායිම් ඇතුළත අක්කර දෙකකුත් රූඩ් දෙකක් (අ.2, රූ.2, පර්.0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු බී. ජී. සී. පුෂ්පකුමාර විසින් මෑතකදී මැන සාදන ලද අංක 853 හා 1997.07.10 දින දරන පිඹුරට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල බුත්තල වැදිරට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුළත, මුප්පනේ ග්‍රාමයේ බණ්ඩාරවාඩියේ පිහිටි, "රත්මල්ගස්ආර" යනුවෙන් ප්‍රකට හා හැඳින්වෙන ඉඩමේ, බලයලත් මිනින්දෝරු බී. ජී. සී. පුෂ්පකුමාර විසින් මැන සාදන ලද අංක 853 හා 1997.07.10 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට: බණ්ඩාර වාඩිය සිට නක්කලට යන අඩි පාර ද, නැගෙනහිරට : රත්මලේ ඔය ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ එච්. එම්. මුදලිහාමි හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : රජයේ ඉඩම ද යන මායිම් ඇතළත අක්කර දෙකකුත් රූඩ් දෙකක් (අ. 2, රූ. 2, පර්.0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ ඉහි පිහිටි සියලු දේ. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරි.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

03-315/2

---

### සීමාසහිත සෙලාන් බැංකුව - මතුගම ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 7110140.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2003 පෙබරවාරි මස 11 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. බී. එස්. ෆොන්සේකා විසින් සහතික කරන ලද 1994.10.31 දිනැති අංක 2409 සහ 1995.07.19 දිනැති අංක 2527 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මතුගම, අලුත්ගම පාර, අංක 61/1 හි පදිංචි ශාන්ත පැස්කුවල් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිලක්ෂ අසූ දෙදහස් තුන්සිය හැත්තෑ තුනයි ශත පනස් තුනක් (රු. 20,82,373.53) මුදලක්, 2001 ඔක්තෝබර් 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 20,82,373.53 මුදල ද, 2001 නොවැම්බර් 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 2409 සහ 2527 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්දුන් කෝරළේ ඉද්දගොඩ පත්තුවේ කළුතර දිස්ත්‍රික් සංවර්ධන සභාවේ මතුගම සුළු නගර සභා සීමාව තුළ පල්ලිගොඩ පිහිටි අලුත්ගම පාරේ වරිපනම් අංක 61/1 දරන බලයලත් මිනින්දෝරු බී. සී. අමේන්ද්‍ර විසින් සාදන ලද 1976 මාර්තු 19,30 සහ 31 දිනැති අංක 1391 දරන මිණුම් සැලැස්මේ සඳහන් බටමුල්ලේවත්ත සහ බටමුල්ලේලන්දේවත්ත නැමැති එහි පිහිටි ගස්, වගාව සහ ගොඩනැගිලි සමග ඉඩමේ කැබැලි අංක 2ඒ ලකුණු කල ඉඩම් කොටසට (කළුතර දිසා අධිකරණයේ අංක 17919/බෙදුම් නඩුවේ ගොනුව ඇති බලයලත් මිනින්දෝරු ඩී. බී. රාජපක්ෂ විසින් සාදන ලද 1939 මාර්තු 21 දිනැති අංක 3149 දරන මිණුම් සැලැස්මේ කැබැලි අංක 2 ලකුණු කල ඉඩමේ අතුරු බෙදීමක් වන) මායිම් උතුරට : මෙම ඉඩමේ කැබැලි අංක 2බී ද, නැගෙනහිරට : රජයේ ඉඩම ද, දකුණට : මෙම ඉඩමේ කැබැලි අංක 3 සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පෙරකී අංක 1391 දරන සැලැස්ම අනුව පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) විශාල, ඉඩම. මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 232/262 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

03-302/1

---

### සීමාසහිත සෙලාන් බැංකුව - මීරිගම ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

ගිණුම් අංකය : 078-01948593-001.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 නොවැම්බර් මස 27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ටී. කේ. කළුආරච්චි විසින් සහතික කරන ලද 2007 ජනවාරි මස 23 වැනි දිනැති අංක 197 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මීරිගම පදිංචි රාජසුන්දර සේනාධීරගේ විජේසිංහ රාජසුන්දර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හාරලක්ෂ විස්තුන්දහස් පන්සිය හයයි ශත අනූ එකක (රු. 4,23,506.91) මුදලක්, 2007 අගෝස්තු 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 4,23,506.91 මුදල ද, 2007 සැප්තැම්බර් මස 1 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 197 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ හාපිටිගම් කෝරළේ උඩුගහ පත්තුවේ මීරිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ උඩුගහ අංක 2 උප කාර්යාල ප්‍රදේශය ඇලපිලියාව පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් සාදන ලද 2004.08.09 දිනැති අංක 926/2004 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වැරැල්ලකැලේවත්ත නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 1 සහ රජයට අයිති සුසාන භූමිය ද, නැගෙනහිරට : පී. එම්. ප්‍රේමරත්නට අයිති මෙම ඉඩමේ කොටස ද, දකුණට : පාර (පී. එස්.) සහ බස්නාහිරට : පාර (එච්) නාල්ල සිට මීරිගම සහ ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් පහලොවයි දශම බිංදුවයි හතක් (අ. 0, රූ. 0, පර්. 15.07) විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒජ් 295/185 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

03-302/2

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

ණය අංකය : 6/42544/එච්6/425, 6/44268/එච්6/797.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය 2006.03.09 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් විසිඑක් ලක්ෂ තිස් දෙදහස් හාරසිය විසිදෙකකුත් ශත තිහක (රු. 21,32,422.30) මුදල සහ 2008 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්ලක්ෂ එකොලොස් දහස් අටසිය අසූ හතකුත් ශත තිස් තුනක් (රු. 3,11,887.33) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොළිය ද, රුපියල් දෙලක්ෂ හැත්තෑ හතර දහස් නවසිය අනූවක් (රු. 2,74,990) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවලදී ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකයට මත පොළිය ද රුපියල් දහතුන් ලක්ෂ තිස් අට දහස් අටසිය හතලිස් හතකුත් ශත අනූ නවයක් (රු. 13,38,847.99) සඳහා වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියළු මුදල් හා දරා ඇති සියළු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය හා වත්කම් කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1248, 1807 සහ 2363 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කොට්ඨාසයේ, වැල්ලවාය කෝරළේ, රත්මල් වැහැර ග්‍රාමයේ පිහිටි කෝන්ගහවත්ත සහ බුහරේහේන යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, මොණරාගල බලයලත් මිනින්දෝරු ඩබ්. විල්මට් සිල්වා විසින් මැන සාදන ලද අංක 1353 හා 2001.01.07 දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් අංක 2 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන, උතුරට : පාර දිගට ඇති රිසවේසම, නැගෙනහිරට : ලොට් අංක 26 (ආර) ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත, ඉහත කී පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් දෙකයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 2.5) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියළු දේ. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

**අංක 2364 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද වත්කම් විස්තරය**

පහත දැක්වෙන යන්ත්‍රෝපකරණ, එනම් -

| *විස්තර* | *ප්‍රමාණය* |
|---|---|
| කැටපිලර් බුල්ඩෝසරය<br>චැසි අංකය - 09Z03172<br>එන්ජින් අංකය - 3304D1 | 01 |

ඇතුළුව සම්පූර්ණ චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සහ ඊට අදාළ අමතර කොටස්, උපාංග හා මෙවලම්.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

03-315/1

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - නුවරඑළිය ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.01.22 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද 2007.01.24 දින සහ අංක 1055 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රොෂාන් ශ්‍රිපාල් පීරිස් සහ නිරෝෂා සංජීවනී පීරිස් විවාහයට පෙර සමරනායක යන අය ණයකරුවන් හැටියට. පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහත්ලක්ෂ විසිතුන්දහස් දෙසීය විසිදෙකයි ශත අනූඅට (රු.27,23.222.98) ක මුදලක් 2008.06.30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 27,23,222.98 ක මුදලට 2008.07.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 1055 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කොරතොට ගමේ, මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් 1998.12.16 දින සහ අංක 1539 දරන පිඹුරෙහි ලොට් අංක 21 දරන ඉඩම් කොටස වන උතුරට : ලොට් අංක 22 න් ද, නැගෙනහිරට : ලොට් අංක 39 න් ද, දකුණට : ලොට් අංක 39 න් ද සහ බස්නාහිරට : ලොට් අංක 44 න් ද මායිම් වූ එකී අංක 1539 දරන පිඹුර ප්‍රකාරව ද පර්චස් අටයි දශම එකයි හතර (අ. 0, රූ. 0, පර්. 8.14) ක් විශාලත්වය ඇති ඉඩම සමග වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1166/241 යටතේ ලියාපදිංචි වී ඇත.

1055 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-341/1

**පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - බම්බලපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2008.12.17 වන දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් දොන් චින්තක පුල්ලෙපෙරුම විසින් කලින් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව් 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. ද පොන්සේකා විසින් සහතික කරන ලද අංක 352 සහ 2008.03.05 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස්කරයන් මත 2008.10.31 වන දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දහතුන් ලක්ෂ පහළොස් දහස් දෙසීයය හතළිස් නමයයි ශත හතළිස් නමය (රු. 13,15,249.49) ක මුදල සහ එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් දොළොස් ලක්ෂ අට දහස් හත්සිය පනස් තුනයි ශත හැට තුන (රු. 12,08,753.63) ක මුදල මත 2008.11.01 දින සිට වර්ෂයකට 29% බැගින් පොලිය ද, පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේද යත් එකී අංක 352 දරන උකස්කරය යටතේ අයවිය යුතු රුපියල් දහතුන් ලක්ෂ පහළොස් දහස් දෙසියය හතළිස් නමයයි ශත හතළිස් නමය (රු. 13,15,249.49) ක මුදල සහ 2008.11.01 දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134 හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දැනට කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ, සල්පිටි කෝරලයේ, පල්ලේ පත්තුවේ හල්පිට පිහිටි දෙල්ගහකනත්ත හෙවත් බතලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ලාල් ගුණසේකර විසින් මැන සාදන ලද අංක 3471 සහ 1990.09.02 දින දරන සැලැස්මේ ලොට් 2 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : එකී සැලැස්මේ ලොට් 3 (අඩි 2 ක් පළල පාර), නැගෙනහිරට : පාර, දකුණට : එකී සැලැස්මේ ලොට් 1 සහ බස්නාහිරට : එකී සැලැස්මේ ලොට් 1 යන මායිම් තුළ පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක් විශාල

ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේ සමග වේ. ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1802/182 හි ලියාපදිංචි කර ඇත.

එකී 3471 දරන සැලැස්මේ ලොට් 3 මත මාර්ග අයිතිය ද සමඟින් වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය අයකර ගැනීම්.

03-340/8

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - ලෝක වෙළඳ මධ්‍යස්ථානය ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2008.12.17 වන දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් වයඹ ට්‍රේඩර්ස්හි හවුල්කරුවන් වන සේදුඅබ්දුල් කාදර් වහිදා රහුමාන් සහ සාහුල් හමීඩ් සදිකීන් බන්ධනදායීන් වශයෙන් ද සහ සාහුල් හමීඩ් සදිකීන් උකස්කරු වශයෙන්ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව් 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. ෆුහාඩ් විසින් ලියා සහතික කරන ලද අංක 2483 සහ 1996 දෙසැම්බර් 17 දිනැති උකස්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වී. එගොඩගේ විසින් ලියා සහතික කරන ලද අංක 24 සහ 1999 අප්‍රේල් 16 දිනැති උකස්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක. 1386 සහ 2003 ඔක්තෝබර් 23 දිනැති උකස්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. පී. පල්ලියගුරු විසින් ලියා සහතික කරන ලද අංක 129 සහ 2005 ජුනි 29 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2008 නොවැම්බර් මස 30 වන දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් තුන්සියය හතළිස් අට ලක්ෂ විසිහත් දහස් එකසියය හැත්තෑ තුනයි ශත තිස් හත (රු.3,48,27,173.37) ක මුදල සහ එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2008 දෙසැම්බර් 01 වන දින සිට

(i) රුපියල් හැටතුන් ලක්ෂ විසිපන් දහස (රු. 63,25,000) ක මුදල මත වර්ෂයකට 22% බැගින් පොලිය ද,
(ii) රුපියන් විසිපන් ලක්ෂය (රු.25,00,000) ක මුදල මත වර්ෂයකට 22% බැගින් පොලිය ද,
(iii) රුපියල් විසිපන් ලක්ෂය (රු.25,00,000) ක මුදල මත වර්ෂයකට 22% බැගින් පොලිය ද,
(iv) රුපියල් තිස්පන් ලක්ෂය (රු.35,00,000) ක මුදල මත වර්ෂයකට 22% බැගින් පොලිය ද,
(v) රුපියල් නම ලක්ෂ හැට දෙදහස (රු.9,62,000) ක මුදල මත වර්ෂයකට 22% බැගින් පොලිය ද,
(vi) රුපියල් එකසිය පහළොස් ලක්ෂ හතළිස් හතර දහස් තිස් තුනයි ශත විසි පහ (රු. 11,544,033.25) ක මුදල මත රුපියල් පනස් ලක්ෂය (රු. 50,00,000) දක්වා වර්ෂයකට 22.5% බැගින් සහ රුපියල් පනස් ලක්ෂ (රු. 50,00,000) යේ සීමාවට ඉහළින් වර්ෂකට 38% බැගින් පොලිය ද,

පැන් ඒෂිය බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

එකී උකස්කරයන් යටතේ අයවිය යුතු රුපියල් තුන්සියය හතළිස් අට ලක්ෂ විසිහත් දහස් එකසියය හැත්තෑ තුනයි ශත තිස් හත (රු.34,827,173.37) ක මුදල සහ 2008.12.01 දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2483 සහ 24 දරන උකස්කරයන් මගින් බැංකුවට උකස්කර ඇත්තා වූ මෙහි පලමු උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ දේපල සහ ඉහත කී අංක 1386 සහ 129 දරන උකස්කරයන් මගින් බැංකුවට උකස්කර ඇත්තාවූ මෙහි දෙවන උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද, දේපලද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134 හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### පලමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාව තුළ, බටහිර අලුත්කඩේ කොට්ඨාස අංක 17 පියර් සයිබු වීදියේ වරිපනම් අංක 86 දරන බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් මැන සාදන ලද අංක 6685 සහ 1996.11.21 දින දරන සැලැස්මේ ලොට් A බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : පියර් සයිබු වීදියේ වරිපනම් ගාඩින් අංක 90, 90/1 සිට 90/7 සහ පරණ යෝනක වීදියේ වරිපනම් අංක 202, 204 සහ 206 සහ හල්ස්ඩොප් වීදියේ වරිපනම් අංක 62, නැගෙනහිරට : හල්ස්ඩෝප් වීදියේ අංක 62 සහ 64, දකුණට : පියර් සයිබු වීදියේ වරිපනම් අංක 84 සහ හල්ස්ඩෝප් වීදියේ අංක 64 සහ බස්නාහිරට : ලොට් 7 ඒ බිම් කැබැල්ල සහ බලයලත් මිනින්දෝරු ඒ. රෙක්ස් ෆොන්සේකා විසින් මැන සාදන ලද අංක 2100 සහ 1993.07.21 දිනැති සැලැස්මේ ලොට් 1 කැබැල්ල යන මායිම් තුළ පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම බිංදුවයි හත (අ. 0, රූ. 0, පර්. 15.07) ක් හෝ හෙක්ටයාර් 0.03811 විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේ සමග වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 868/236 හි ලියාපදිංචි කර ඇත.

එකී 6685 දරන සැලැස්මේ ලොට් 7 ඒ දරන මාර්ගය සඳහා වෙන්කිරීම ද සමඟින් වේ.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුළ, පෙර මාලිගාකන්ද කොට්ඨාසය සහ දැනට නැගෙනහිර කුප්පියාවත්ත කොට්ඨාසයේ මාලිගාකන්ද පාර වයිට් පාර්ක්හි වරිපනම් අංක 1 (කොටසක්) වන (සර්වෙයර් ජනරාල් විසින් සාදන ලද 1947 මාර්තු 08 දිනැති අංක 3 දරන රජයේ දේපල සැලැස්මේ ලොට් 1 සහ අංක 4 දරන රජයේ දේපල සැලැස්මේ ලොට් 1 සහ රජයේ දේපල සැලැස්මේ දැක්වෙන ඉහත කී ඉඩම් කැබැලි දෙක අතරෙහි පිහිටි ඉඩම ද ඒකාබද්ධ කොට අනු බෙදුම් කරන ලද) ලොට් 2 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : ලොට් 3 දරන බිම්

කැබැල්ල, නැගෙනහිරට : වයිට් පාර්ක්හි වරිපනම් අංක 1 හි ඉතිරි කොටස, දකුණට : ලොට් 1 දරන බිම් කැබැල්ල සහ බස්නාහිරට : ලොට් 13 කැබැල්ල යන මායිම් තුල පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම බිංදුවයි දෙක (අ.0, රූ. 0, පර්. 8.02) ක් හෝ හෙක්ටයාර් 0.0203 ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ සමග වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 785/195 හි ලියාපදිංචි කර ඇත.

මෑතකදී සකස් කරන ලද අංක 96 දරන සැලැස්ම අනුව එකී ලොට් 2 කැබැල්ල පහත දැක්වෙන පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුළ, පෙර මාලිගාකන්ද කොට්ඨාසය සහ දැනට නැගෙනහිර කුප්පියාවත්ත කොට්ඨාසයේ දැනට මාලිගාකන්ද පාර (වයිට් පාර්ක්) වරිපනම් අංක 181/25 (පෙර මාලිගාකන්ද පාර වයිට් පාර්ක් වරිපනම් අංක 1 (කොටසක්) වන බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 96 සහ 1988 අගෝස්තු 3 දිනැති සැලැස්මේ ලොට් 2 ඉඩම වන) බලයලත් මිණින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 61/94 සහ 1994 අගොස්තු 24 දිනැති සැලැස්මේ ලොට් 2 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 96 සහ 1988 අගෝස්තු 3 දිනැති සැලැස්මේ ලොට් 3 කැබැල්ල, නැගෙනහිරට : වයිට් පාර්ක්හි වරිපනම් අංක 1 හි ඉතිරි කොටස, දකුණට : බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 96 සහ 1988 අගෝස්තු 3 දිනැති සැලැස්මේ ලොට් 1 කැබැල්ල සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 96 සහ 1988 අගෝස්තු 03 දිනැති සැලැස්ම ලොට් 13 කැබැල්ල සහ මායිම් තුළ පිහිටා ඇති එකී අංක 61/94 සැලැස්මේ අනුව ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම බිංදුවයි දෙක (අ. 0. රූ. 0, පර්. 8.02) ක් හෝ හෙක්ටයාර් 0.0203 ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ සමග වේ.

බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 96 සහ 1988 අගෝස්තු 03 දිනැති සැලැස්මේ ලොට් 13 මත මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය අයකරගැනීම්.

03-340/4

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොටහේන ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2008.09.24 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එස්. ඒ. එස්. මෝටර්ස් හි හවුල්කරුවන් වන මොහොමඩ් ලෙබ්බේ සහුරුවාන් බීබී සහ මොහොමඩ් සක්කාරියා සිහානා අස්මි විසින් කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන, ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් සහතික කර ලද අංක 881 සහ 2005 නොවැම්බර් මස 16 වන දින දරන සහ අංක 1146 සහ 2006 නොවැම්බර් මස 30 වන දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද, එකී උකස්කර මත 2008 අගෝස්තු මස 05 වන දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් පස් මිලියන හත්ලක්ෂ තිස් හත් දහස් පන්සිය අනූවයි ශත හැට පහක (රු.57,37,590.65)මුදලක් සහ රුපියල් පස් මිලියනයක (රු. 50,00,000) මුදල මත 2008 අගෝස්තු මස 06 වන දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 29% බැගින් පොලිය ද සහ 2008 අගෝස්තු මස 31 වන දින දක්වා රුපියල් එක් මිලියන විසිතුන් දහස් අටසිය විස්සයි ශත හැත්තෑ දෙකක (රු.10,23,820.72) මුදලක් සහ එකී එක් මිලියන විසිතුන් දහස් අටසිය විස්සයි ශත හැත්තෑ දෙකක (රු. 10,23,820.72) මුදල මත 2008 සැප්තැම්බර් මස 01 වන දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 38% බැගින් පොලිය ද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්පසු, බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් යෝජනා සම්මත කරගනු ලැබේ.

එකී අංක 881 සහ 1146 දරන උකස්කර යටතේ අයවිය යුතු එකී රුපියල් හය මිලියන හත්ලක්ෂ හැට එක් දහස් හාරසිය එකොළහයි ශත තිස් හතක (රු. 6,761,411.37) මුදල සහ ඉහත කී ලෙස එකී දිනවල සිට එම විකිණීමේ දිනය දක්වා ලැබිය යුතු පොලිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134 දරන ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසි කරු වන පී. කේ. ඊ. සේනාපති වෙත, 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස,

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල - මාබෝලේ මහ නගර සභා සීමාව තුළ පිහිටි මාබෝලේ, මීගමු පාරේ පිහිටි දෙල්ගහවත්ත සහ සෙල්ලවයිච්චිගේ කුඹුර හෝ දෙල්ගහ කුඹුර නමැති ඉඩමේ (බලයලත් මිනින්දෝරු එස්. සිංගනායගම් විසින් සාදන ලද අංක 611 සහ 1962 මාර්තු මස 10 දින දරන සැලැස්මේ ඒ බිම් කැබැල්ල සහ බී බිම් කැබැල්ලේ කොටසක් නැවත මැන ඒකාබද්ධ කිරීමක් වන) මීගමු පාරේ, අංක 684 වරිපනම් අංකය දරන බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් සාදන ලද අංක 261/2005 සහ 2005.07.04 දින දරන සැලැස්මේ නිරූපිත අංක 1 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති එකී අංක 1 දරන බිම් කැබැල්ලට මායිම් උතුරට : දූව වත්ත පාර (මහජන පාර) ද, නැගෙනහිරට : මීගමු පාරේ වරිපනම් අංක 706 දරන ස්ථානය ද, දකුණට :මීගමු පාරේ වරිපනම් අංක 704 දරන ස්ථානය ද, බස්නාහිරට : මීගමු පාර ද සහ එහි ප්‍රමාණය පර්චස් නවයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.25) සහ එහි තුළ ඇති සියලු දේ සමග වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය අයකර ගැනීම්.

03-340/7

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මොරටුමුල්ල ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008.11.27 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2006.03.24 වැනි දින සහ අංක 7366 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හේ-වුඩ් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටහතර ලක්ෂ දාසය දහස් හයසිය හැත්තෑනවයයි ශත පනස්හය (රු.64,16,679.56) ක මුදලක් 2008.05.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 64,16,679.56 ක මුදලට 2008.06.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 7366 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී වෙත උකස් කොට ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, අදිකාරි පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව තුල කිදෙල්පිටියහි පිහිටි "මිල්ලගහලන්ද" නමැති ඉඩමට බලයලත් මානක පී. ඒ. ඩී. බී. විජේරත්න විසින් මැන සාදන ලද අංක 2/92 සහ 1992 මැයි මස 30 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් බී" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : "ලොට් ඒ " වලින් ද, නැගෙනහිරට : ලීලාවතීට සහ අනෙක් අයට අයත් ඉඩමෙන් ද, දකුණට : පිඹුරු අංක 725 ට අයත් ලොට් 3 න් ද සහ බස්නාහිරට : පිඹුරු අංක 725 ට අයත් ලොට් 1න් ද මායිම් වූ රූඩ් එක (අක්කර 0, රූඩ් 1, පර්චස් 0) ක් විශාල ඉඩම තුල පිහිටි සියළුම දේත් සමග හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 136/65 හි ලියාපදිංචි කර ඇත.

කිදෙල්පිටිය පිහිටි "මිල්ලගහලන්ද" නමැති ඉඩමට බලයලත් මානක ඒ. පී. දැරණියගල විසින් මැන සාදන ලද අංක 725 සහ 1992 මැයි මස 5 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 3" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 1 සහ 2 න් ද, නැගෙනහිරට : ලීලාවතීට සහ අනෙක් අයට අයත් ඉඩමෙන් ද, දකුණට : පිඹුරු අංක 696 ට අයත් ලොට් ඒ 2 වලින් ද, සහ බස්නාහිරට : ඩේමන් පීරිස්ට අයත් ඉඩමෙන් ද මායිම් වූ පර්චස් විසිපහයි දශම හත (අ. 0, රූ. 0, පර්. 25.7) ක් විශාල ඉඩම තුල පිහිටි සියළුම දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-341/10

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මාළිගාවත්ත ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008.04.24 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූද 2005.10.04 වැනි දින හා අංක 1415 දරන බැඳුම්කරය මත රණසිංහ කංකානම්ලාගේ වික්ටර් රණසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකොලොස් ලක්ෂ අනූනමදහස් හත්සිය අනූඑකයි ශත තුන (රු.11,99,791.03) ක මුදලක් 2007.12.31 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 11,99,791.03ක මුදලට 2008.01.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 1415 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ, උඩුගම්පොල උප කාර්යාලය තුල උඩුගම්පොල ගමේ පිහිටි කහටගහලන්ද සහ දවටගහලන්ද කැබැල්ල නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක ඩී පී. ඩී. ජේ. දිසානායක විසින් ලියා සහතික කරන ලද 1996 ජුනි මස 13 වැනි දින අංක 2158ඒ දරන පිඹුරේ ලොට් අංක 18 දරන කොටසේ උතුරට : ලොට් අංක 19 දරන කොටසින් ද, නැගෙනහිරට : නිමල් ගුණවර්ධනට අයිති ඉඩමෙන් ද, දකුණට : ලොට් අංක 17න් ද සහ බස්නාහිරට : ලොට් අංක 21න් ද මායිම් වූ පර්චස් පහළොවයි දශම බිංදුවයි හය (අක්කර 0, රූඩ් 0, පර්චස් 15.06) ක් විශාලත්වය ඇති ඉඩම ගොඩනැගිලි සියළු දේත් සමඟ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 238/126 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ, උඩුගම්පොල උප කාර්යාලය තුළ උඩුගම්පොල ගමේ පිහිටි, කහටගහලන්ද සහ දවටගහලන්ද කැබැල්ල නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක ඩී. පී. ඩී. ජේ. දිසානායක විසින් ලියා සහතික කරන ලද 1996 ජුනි මස 13 වැනි දින අංක 2158ඒ දරන පිඹුරේ ලොට් අංක 19 දරන කොටසේ උතුරට : ලොට් අංක 20 සහ සී කරුණාසේකරට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : සී. කරුණාසේකර සහ නිමල් ගුණවර්ධනට අයිති ඉඩම් වලින් ද, දකුණට : ලොට් අංක 18න් ද සහ බස්නාහිරට : ලොට් අංක 21න්ද මායිම් වූ පර්චස් පහළොවයි දශම බිංදුවයි හය (අ. 0, රූ. 0, පර්. 15.06) ක් විශාලත්වය ඇති ඉඩම ගොඩනැගිලි සියළු දේත් සමඟ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 238/127 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක ඩී. පී. ඩී. ජේ. දිසානායක විසින් මැන සාදන ලද 1998 සැප්තැම්බර් 14 වැනි දින සහ අංක 2158 ඒ පිඹුර ප්‍රකාර ලොට් අංක 19 විස්තර කර ඇති මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
සාමාන්‍යාධිකාරිනී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-341/9

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - දෙමටගොඩ ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.01.22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. සමරනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූද 2007.05.15 දින සහ අංක 1615 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ෆාතිමියා ෆසීනා සිත්තීක් සෙයිඩ් නබීල් සහ මොහමඩ් ඉස්මයිල් අලීම් සිද්දීක් සෙයිඩ් නබීල් යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකොලොස් ලක්ෂ විසිඑක් දහස් නවසිය තිස්හතයි ශත විසිඑක (රු.11,21,937.21) ක මුදලක් 2008.10.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයන් එකී රු. 11,21,937.21ක මුදලට 2008.11.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1615 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දකුණ, අඹතලෙන් පහල කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවේ වෙන්නවත්ත තුල පිහිටි බ්‍රැන්ඩියවත්ත පාර, වරිපනම් අංක 43/18 ට අයත් "මීගහඕවිටවත්ත" නමැති ඉඩමට බලයලත් මානක පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද 1995.04.01 දිනැති අංක 758 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද "ලොට් 1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : මීගහවත්ත ඉඩමේ කොටසකින් ද, නැගෙනහිරට : පාරෙන් ද (අඩි 12-13 ත් අතර පළලැති) දකුණට : මීගහඕවිට කුඹුරෙන් ද සහ බස්නාහිරට : මීගහවත්ත ඉඩමේ කොටසකින් ද මායිම් වූ එකී අංක 758 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක විශාල ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී1012/179 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-341/8

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - පොළොන්නරුව ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008.11.27 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. පී. එස්. හරිස්චන්ද්‍ර විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2006.11.06 දින සහ අංක 2476 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුලබැද්ද දූරගේ සිරිපාල සහ ගරුවත්තේ විදාන රාළහාමිලාගේ දොන් රෝහිණී ජයතිලක ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දසලක්ෂ දහනවදහස් නවසිය විසිඅටයි ශත දොලහ (රු.10,19,928.12) ක මුදලක් 2008.09.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 10,19,928.12 ක මුදලට 2008.10.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2476 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව කොට්ඨාසය හි මැදපත්තු, ඇතුමල්පිටිය, ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 155 අයත් නිස්සංකමල්ලපුර ගමෙහි පිහිටි ලොට් 768 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 3950 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : පිඹුරු

අංක 3950 ට අයත් ලොට් 670න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 3950 ට අයත් ලොට් 767, 1/3 න් ද, දකුණට : එෆ්. එස්. පී. 7649 න්ද සහ බස්නාහිරට : පිඹුරු අංක 3950 ට අයත් ලොට් 769න්ද මායිම් වූ එකී ඉඩම තුළ පිහිටි පස්, ගහකොළ, වැව්ලි සහ අනෙකුත් සියළු දේත් සමග පිහිටි ඉඩමවේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-341/7

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - බම්බලපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2009.01.28 වැනි දින පවත්වනලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

හෙසනයිට් ප්‍රොපටි ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ.ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1947 සහ 2006.02.01 දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

එකී උකස්කරයන් මත 2009.01.15 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හැට හතර ලක්ෂ අසූ හයදහස් හත්සිය තිහයි ශත හතළිහ (රු. 64,86,730.40) ක මුදල සහ එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් හැට හතර ලක්ෂ හැත්තෑ හත්දහස් හත්සිය හැත්තෑ හයයි ශත හැත්තෑ නමය (රු. 64,77,776.79) ක මුදල මත 2009.01.16 වැනි දින සිට වර්ෂයකට 30% බැගින් පොලිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින්ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්

එකී අංක 1947 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හැට හතර ලක්ෂ අසූ හයදහස් හත්සිය තිහයි ශත හතළිහ (රු. 64,86,730.40) ක මුදල සහ 2009.01.16 දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් අංක 474 මහානාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන ආර්. එස්. එම්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස,

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, දෙහිවල- ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ, දෙහිවල පිහිටි වැන්ඩවර්ට් පෙදෙසේ වරිපනම් අංක 31 දරන ඇපෝතිකරිවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් මැන සාදන ලද අංක 374 සහ 1998.09.29 දින දරන සැලැස්මේ ලොට් 3800 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : වැන්ඩර්වට් පෙදෙස (පාර), නැගෙනහිරට : වැන්ඩර්වට් පෙදෙසේ වරිපනම් අංක 29 දරන ලොට් 1 ඊජ් දරන කැබැල්ල, දකුණට : ලොට් 2264 කැබැල්ල සහ වරිපනම් අංක 33/1 දරන ලොට් 1ජී 3 කැබැල්ල සහ වින්සර් ඇවනිව් අංක 8 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : වැන්ඩර්වට් පෙදෙසේ වරිපනම් අංක 33 දරන ලොට් 2466 කැබැල්ල සහ ලොට් 3494 කැබැල්ල සහ වින්සර් ඇවනිව් වරිපනම් අංක 33 ඒ දරන ලොට් 3495 කැබැල්ල යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම එකයි හත (අ. 0, රූ. 0, පර්. 20.17) ක් විශාල බිම් කැබැල්ල සහ එහි තුල පිහිටි සියලු දේ වේ.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දෙහිවල 82/216 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය අයකර ගැනීම්

03-340/3

---

**පෑන් ඒෂිය බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - පංචිකාවත්ත ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2008.12.17 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් දේවපුර සුනිල් ශාන්ත කුමාර යන අය විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද පිළිවෙලින් අංක 1336 සහ 2527 සහ 2004.06.29 සහ 2007.12.04 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

එකී උකස්කරයන් මත 2008.11.18 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දාහතර ලක්ෂ පනස් පන්දහස් හාරසිය හැට අටයි ශත අට (රු. 14,55,68.08) ක මුදල සහ එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් දහතුන් ලක්ෂ හැට හත්දහස් හයසිය හැට හතයි ශත හැට හය (රු. 13,67,667.66) ක මුදල මත 2008.11.19 දින සිට වර්ෂයකට 29% බැගින් පොලිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 1336 සහ 2527 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු රුපියල් දාහතර ලක්ෂ පනස් පන්දහස් හාරසිය හැට අටයි ශත අට

(රු.1,455,468.08) ක මුදල සහ 2008.11.19 දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134 හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස,

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුල අතුරුගිරිය වල්ගම අතුරුගිරිය ප්‍රධාන මාර්ගයේ කොට්ටාව හරහා පිහිටි ගල්දොඩලන්ද නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු ජේ. ලොරෙන්සුහේවා විසින් මැන සාදන ලද අංක 98 සහ 1998.05.10 දිනැති සැලැස්මේ ලොට් 2 දරන කැබැල්ලේ නැවත මැනුමක් වන) බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් මැන සාදන ලද අංක 2129 සහ 2003.11.28 දින දරන සැලැස්මේ ලොට් 2 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : කනත්ත පාර, නැගෙනහිරට : එකී අංක 98 සැලැස්මේ ලොට් 1 දරන (අඩි 15 ක් පළල පාරක් සඳහා වූ වෙන්කිරීම) සහ එකී අංක 98 සැලැස්මේ ලොට් 3 දරන කැබැල්ල, දකුණට : එකී අංක 98 සැලැස්මේ ලොට් 3 දරන කැබැල්ල සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු පී. කේ. සුමනදාස විසින් මැන සාදන ලද අංක 76/443 සහ 1981.06.01 දිනැති සැලැස්මේ ලොට් 21 දරන බිම් කැබැල්ල සහ මායිම් තුල පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් පහළොව (අ. 0, රූ. 0, පර්. 15) ක් හෝ හෙක්ටයාර් 0.03794 ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ පලතුරු ආදී සියලු දේ සමග වේ.

එකී අංක 98 දරන සැලැස්මේ ලොට් 9, 22 සහ 1 මත මාර්ග අයිතියද සමඟින් වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය අයකර ගැනීම්.

03-340/5

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොටහේන ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් ආරියප්පන් පෙරුමාල් කුබේරන් විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපෙරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රී විසින් සහතික කරන ලද අංක. 1057 සහ 2006 ජූලි 31 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

එකී උකස්කරය මත 2009 ජනවාරි මස 08 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් විසි හය ලක්ෂ දහනම දහස් හත්සිය දහසයයි ශත හැට පහ (රු. 2,619,716.65) ක මුදල සහ එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් විසිතුන් ලක්ෂ අනූ දෙදහස (රු. 2,392,000) ක මුදල මත 2009 ජනවාරි මස 09 දින සිට වර්ෂයකට 27% බැගින් පොලිය ද, පැන් ඒෂියා බැන්කිං කෝප්පරේෂන් ලිමිටඩ් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින්ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්, එකී අංක 1057 දරන උකස්කරය යටතේ අයවිය යුතු රුපියල් විසි හය ලක්ෂ දහනම දහස් හත්සිය දහසයයි ශත හැට පහ (රු.2,619,716.65) ක මුදල සහ 2009 ජනවාරි මස 09 දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් අංක 474 හි ආර්. එස්. එම්. ඔක්ෂනියර්ස් හි බලයලත් වෙන්දේසිකරු රංජිත් එස්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභාවේ බොරලැස්ගමුව උපකාර්යාල සීමාව තුල, කොළඹ සංවර්ධන සභා සීමාව තුල බොරලැස්ගමුව එගොඩවත්ත පාරේ වරිපනම් අංක 18/16 සහ 18/16 1/1 දරන දමිනගවත්ත හෙවත් මාරගහවත්ත දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් මැන සාදන ලද අංක 1877 සහ 1968.03.24 දින දරන සැලැස්මේ ලොට් E1 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : අංක 706 සැලැස්මේ ලොට් බී දරන බිම් කැබැල්ල, නැගෙනහිරට : ලොට් E2 දරන බිම් කැබැල්ල, දකුණට : දැනට කේ.එඩ්වින්ට අයත් ඉඩම සහ බස්නාහිරට : දැනට එම්. ජේ. පෙරේරාට අයත් ඉඩම සහ අංක 706 සැලැස්මේ ලොට් A දරන බිම් කැබැල්ල යන මායිම් තුල පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම තුනයි එක (අ. 0, රූ. 0, පර්. 16.31) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ පලතුරු ආදි සියලු දේ සමග වේ. ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 894/65 හි ලියාපදිංචි කර ඇත.

මෑතදී මැන සාදන ලද සැලැස්මක් අනුව එකී අංක 1877 සැලැස්මේ ලොට් E1 දරන ඉඩම් කැබැල්ල පහත දැක්වෙන අයුරින් විස්තර කර ඇත :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභාවේ බොරලැස්ගමුව උපකාර්යාල සීමාව තුල පිහිටා ඇති බොරලැස්ගමුව එගොඩවත්ත පාරේ 5 වැනි පටුමගේ වරිපනම් අංක 18/16 දරන දමිනගවත්ත හෙවත් මාරගහවත්ත දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් මැන සාදන ලද අංක 35/06 සහ 2006.05.27 සහ වඩාත් නිවැරදිව 2006.05.28 දින දරන සැලැස්මේ ලොට් 1 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට ඃ පාර, නැගෙනහිරට ඃ 5 වැනි පටුමගේ වරිපනම් අංක 18/17 දරන පරිශ්‍රය, දකුණට ඃ 5 වැනි පටුමගේ වරිපනම් අංක 18/14 දරන පරිශ්‍රය සහ බස්නාහිරට ඃ 5 වැනි පටුමගේ වරිපනම් අංක 18/11 වඩාත් නිවැරදිව 18/14 දරන පරිශ්‍රය සහ පාර යන මායිම් තුල පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම හතයි තුන (අ. 0, රූ. 0, පර්. 15.73) ක් සහ වඩාත් නිවැරදිව පර්චස් පහළොවයි දශම හතයි අට (අ. 0, රූ. 0, පර්. 15.78) ක් විශාල ඉඩම.

එකී 706 දරන සැලැස්මේ ලොට් ඒ සහ බී මත මාර්ග අයිතියද සමඟින් වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය අයකර ගැනීම්.

03-340/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.